# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 85 — 1973 නොවැම්බර් 09 වැනි සිකුරාදා — 1973.11.09

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (IIඅ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1535 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1550 |


## තනතුරු—ඇබෑර්තු

**ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරවනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි**

**1. අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම්**

1 : 1 තමා ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම් කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

"ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම ලැබුවෙකි.

1 : 2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම් කරුවකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙක් වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල භාෂාව විෂයයෙන් සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත්, රාජ්‍ය සේවයෙන් බැහැර තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

1 : 3 නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් අසමත්වීම හේතු කොට ගෙන පරිවාස/පරීක්ෂණ කාලය සහිත සේවය අවසන් කරනු ලැබූ "නව ප්‍රවේශක" රජයේ නිලධාරීන් ව සිටි අය, අංක 640 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව අදාළ තනතුරට හෝ සේවයට නියමිත වූ ඉහළම සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් වීමට හිමිකම් ලබන අන්දමේ සුදුසුකම් ලබා ගෙන සිටිතොත් මිස, එසේ නොමැති නම්, ඔවුන් ගෙන් ලැබෙන අයදුම් පත් භාරගනු නො ලැබේ.

**2. දීමනා**

2 : 1 ඒ ඒ තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුපට අතිරේක වශයෙන්, රාජ්‍ය සේවයෙහි නියුක්ත මාසික වැටුප් ලබන සියලුම විවාහක නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ, VIII වැනි පරිච්ඡේදයෙහි 1 වැනි වගන්තියෙහි දක්වා ඇති පදනම මත විවාහක දීමනාවක් ගෙවනු ඇත.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පලවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

1535—ශී 71070—15,017 (73/10)

2 : 2 (සියලුම දීමනාවන් ද ඇතුලුව) රු. 180 සිට රු. 250 දක්වා මාසික වැටුප්/වේතන ලබන ශ්‍රේණියට අයත් රාජ්‍ය නිලධාරීන්ට මාසික වශයෙන් රු. 7.50 ක විශේෂ දීමනාවක් ගෙවනු ඇත. අවශ්‍ය තැන මෙම දීමනාව ක්‍රමික කිරීමට ඉඩ ඇත.

**3. සේවා කොන්දේසි : සාමාන්‍ය**

3 : 1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි, වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

3 : 2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් නිර්ණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

3 : 3 දිවයිනෙහි ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැක.

**4. ස්ථිර පත්වීම් දරණ රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

4 : 1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 3 වැනි වගන්තියෙහි සඳහන් කොන්දේසි වලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ :—

4 : 1 : 1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතුයැයි සලකනු ලබන්නේ නම් විනා, එසේ නොමැති නම්, සියලුම පත් කිරීම් අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ, හේතුවක් නොදක්වා සේවය කෙළවර කරනු ලැබිය හැකිය.

4 : 1 : 2 රාජ්‍ය සේවයෙහි "නව ප්‍රවේශකයන්" වන සියලුම රාජ්‍ය නිලධාරීහු, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවන් සඳහා, 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතෙහි විධි විධානවලටත්, රාජ්‍යයෙහි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ක්‍රියාත්මකව පවත්නාවූත්, අනාගතයේදී පනවනු ලැබිය හැකි වූත් නීති සහ ව්‍යවස්ථා වෙතොත්, ඒවාටත් අනුකූල විය යුත්තාහ.

4 : 1 : 3 රාජ්‍ය භාෂාවෙන් වැඩ කිරීමට හැකි වන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබා ගන්නා ලෙස සියලුම රාජ්‍ය නිලධාරීන්ට නියම කෙරේ.

4 : 1 : 4 පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත් වීමත්, අවුරුදු දෙකක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි II වැනි ශ්‍රේණියෙන් සමත් වීමත්, (අවශ්‍ය නම්) අවුරුදු තුනක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි III වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාලසීමාව ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයන් තාවකාලිකව අත්හිටවනු ලැබිය හැකිය. නියමිත කාල සීමාව ඉක්මී තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත් වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත් හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත් වන තෙක් හෝ පහත දක්වෙන

4 : 1 : 5 වැනි වගන්තියෙහි විධි විධානයන් බලපවත් වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේ ය.

4 : 1 : 5 පරිවාස කාල සීමාව අවසානයේදී සිංහල ප්‍රවීණතාවය පිළිබඳ නියමිත තත්වයට පැමිණීමට නොහැකි වුවහොත්, එහි ලා ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයෙහි 12 : 13 වැනි වගන්තියෙහි විධි විධානයන් ක්‍රියාත්මක වනු ඇත.

4 : 1 : 6 සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලැබූ අය විෂයෙහි 4 : 1 : 3, 4 : 1 : 4, සහ 4 : 1 : 5 වැනි වගන්ති අදාළ නොවන්නේ ය.

4 : 1 : 7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු, රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාල සීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැක.

4 : 1 : 8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද, වෛද්‍ය පරීක්ෂණයට භාජන කරනු ලැබුවා වූද අය හැර) තෝරා ගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් වන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

**5. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

5 : 1 1972. 01. 01 වැනි දිනට පසු, ස්ථිර සේවයට අයත් තනතුරුවලට හෝ තාවකාලික සේවයට අයත් මාසික වැටුප් සහිත තනතුරුවලට හෝ (දෛනික වැටුප් ජේවි ප්‍රමාණයන් ගෙවනු ලබන—සේවකයන් හැරයි) පත් කරනු ලබන සියලුම රාජ්‍ය නිලධාරීන් විසින් තමන්ගේ ඒකාබද්ධ වැටුපෙන් 6% ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී ගෙවා ඇති ඒකාබද්ධ වැටුපෙන් සියයට 9% ක් රජය විසින් එම අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ඇත. එබඳු තනතුරක් දරන්නකුට (කැමති නම්) තමාගේ මනාපය පරිදි තම මාසික ඒකාබද්ධ වැටුපෙන් තව 6% ක් දක්වා වූ ස්වේච්ඡා දායක මුදලක් එම අරමුදලට ගෙවිය හැක. එහෙත් එම දායක මුදල වෙනුවෙන් රජය විසින් දායක මුදලක් නොගෙවනු ඇත.

5 : 2 1971. 12. 31 වැනි දිනට පෙර රාජ්‍ය සේවයෙහි ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරමින් සිටි රාජ්‍ය නිලධාරීන්, 1972. 01. 01 වැනි දිනට පසු, රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරකට පත් කරනු ලැබුවහොත්, එම තනතුර දරන නිලධාරියාට පමණක් පෞද්ගලික වුවක් වශයෙන් යථෝක්ත විශ්‍රාම වැටුප් හිමිකම නොකඩවා භුක්ති විඳීමට ඉඩදෙනු ඇත. එම රාජ්‍ය නිලධාරියා පෙර පරිදිම වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වනු ඇත.

**6. යුද්ධ සේවා අනුග්‍රහය**

6 : 1 එක්සත් රාජ්‍යයේ යුද්ධාව නිර්ණ සමුදාවන්හි සේවා මුක්ත භටයන්ටද සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජනාරක්ෂක සේවාවන්හි පූර්ණ කාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිට තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්වී නොගිය අයට ද ඉහත කී සියලුම සුදුසුකම් තිබේනම්ද, ඔවුන් මෙම හමුදා වන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතු නම්ද, ඔවුන්ගේ එම සේවය සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම ලබා

ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින්, 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තමතමන් සේවය කළ කාලයත් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

7 : 1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලුම සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නාවූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරීන්ගෙන් යමකු නව තනතුරට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකිද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

7 : 2 නියමිත වේලාවක නියමිත ස්ථානයකදී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

7 : 3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව අයථා අනුග්‍රහයක් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සෙකු කරනු ලැබීමට හේතුවනු ඇත.

7 : 4 අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

7 : 5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ,

**8. සුදුසුකම පිළිබඳ අවශ්‍යතාව සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම**

8 : 1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

---

**අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**ගාල්ලේ බහුතාක්ෂණික ආයතනය—බාහිර කථිකාචාර්ය තනතුරු—1974 වර්ෂය**

ගාල්ලේ බහුතාක්ෂණික ආයතනයේ බාහිර කථිකාචාර්ය තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර පහත සඳහන් ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කර ගාල්ලේ, බහුතාක්ෂණික ආයතනයේ විදුහල්පති වෙත 1973 නොවැම්බර් මස 30 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ යැවිය යුතුය.

අපේක්ෂකයින් තම තමන්ගේ අධ්‍යාපනික, වෘත්තීය හා කාර්මික සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සියලුම විස්තර ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.

2. බාහිර කථිකාචාර්ය තනතුරු වලට අදාල විෂයයන් මෙහි පහත සඳහන් කර තිබේ. පන්ති පැවැත්වෙන මාධ්‍යය විෂයය ඉදිරියෙන් පෙන්නුම් කෙරේ.

| | |
|---|---|
| 1. පොත් තැබීම | සිංහල මාධ්‍යය |
| 2. ගණකාධිකරණය | ,, |
| 3. පිරිවැය ගණකාධිකරණය | ,, |
| 4. ව්‍යාපාර ගණිතය | ,, |
| 5. ව්‍යාපාර හිරණ සඳහා වූ ගණකාධිකරණය | ,, |
| 6. සංඛ්‍යා ලේඛන විද්‍යාව | ,, |
| 7. වාණිජ නීතිය | ,, |
| 8. කාර්මික නීතිය | ,, |
| 9. බදුක්‍රම | ,, |
| 10. විගණනය | ,, |
| 11. සේවක (පිරිස්) කළමණාකාරිත්වය | ,, |
| 12. අලෙවි කළමණාකාරිත්වය | ,, |
| 13. ප්‍රචාරණය සහ මහජන සම්බන්ධතා | ,, |
| 14. වාණිජ අංක ගණිතය | ,, |
| 15. ලඝුලේඛනය | ,, |
| 16. යතුරු ලිවීම | ,, |
| 17. ගණිතය | ,, |
| 18. භෞතික විද්‍යාව | ,, |
| 19. ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම | ,, |
| 20. බිම් මැනීම හා මට්ටම් කිරීම | ,, |
| 21. ගොඩනැගිලි නිර්මාණය | ,, |
| 22. ව්‍යවහාර යාන්ත්‍රික විද්‍යාව | ,, |
| 23. සිවිල් ඉංජිනේරු ද්‍රව්‍ය | ,, |
| 24. සෞඛ්‍ය ඉංජිනේරු විද්‍යාව | ,, |
| 25. සැලසුම් ක්‍රම | ,, |
| 26. ව්‍යුහ හා ද්‍රව්‍ය | ,, |
| 27. ගෘහ නිර්මාණ රාශි | ,, |
| 28. යන්ත්‍ර ඇඳීම | ,, |
| 29. තාප යන්ත්‍ර | ,, |
| 30. විද්‍යුත් තාක්ෂණික විද්‍යාව | ,, |
| 31. කර්මාන්තශාලා මිල කිරීම | සිංහල මාධ්‍යය |
| 32. ව්‍යවහාර ගණිතය | ,, |
| 33. මූලික විද්‍යාව | ,, |
| 34. සමාජ අධ්‍යයනය | ,, |
| 35. ජලනල සවිකිරීම | ,, |
| 36. ගුවන්විදුලි යන්ත්‍ර සේවා කිරීම | ,, |
| 37. මැණික් කැපීම සහ ඔපදැමීම | ,, |
| 38. ස්වයංචල යන්ත්‍රණය | ,, |
| 39. විදුලි කම්බි සවිකිරීම (න්‍යාය) | ,, |

3. බාහිර කථිකාචාර්යවරුන්ට ගෙවන ගාස්තු ඔවුන්ගේ සුදුසුකම්, පළපුරුද්ද හා උගන්වන පන්තිය අනුව පැයකට රු. 5 සිට රුපියල් 15 දක්වා වෙනස් වනවා ඇත.

4. මෙම තනතුර 1974 අවුරුද්දේ ජනවාරි මාසයෙන් පටන්ගෙන එම අවුරුද්දේ දෙසැම්බර් මස අවසන් වීමට නියමිතය. අවශ්‍යතාවයේ හැටියට ඊට කලින් වුවද, අවසන් කරනු ලැබිය හැක.

5. පන්ති පැවැත්වෙනුයේ උදේ 8 සිට සවස 4 දක්වා සහ සවස 4.15 සිට රාත්‍රි 6.45 දක්වා ද හෙයින් මෙම කාලය ඇතුළත උගැන්වීමට හැකි අයගෙන් පමණක් ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලැබේ. තමන්ට සුදුසු කාලවේලා ඉල්ලුම් පත්‍රයේ නිසියාකාරව සඳහන් කළ යුතුය.

6. බාහිර කථිකාචාර්යවරුන් විසින් මධ්‍ය වාර්ෂික පරීක්ෂණයන්හි සහ අභ්‍යන්තර නොවූ පරීක්ෂකයින් නොයොදවන වර්ෂාවසාන පරීක්ෂණයන්හි අමතර ගාස්තුවක් නොමැතිව තමන්ගේ පන්ති වල ශිෂ්‍යයින් පරීක්ෂා කළ යුතුය.

7. රාජ්‍ය සේවයෙහි යෙදී සිටින ඉල්ලුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් මගිනි. එවැනි ඉල්ලුම් පත්‍ර නියම කරන ලද දිනට පෙර ගාල්ලේ බහුතාක්ෂණික ආයතනයේ ආයතනාධිපති වෙත නොලැබුණොත් ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ ප්‍රතික්ෂේප කරනු නොලබන්නේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ඒවා කලට වේලාවට ලැබී ඇති බවට පිළිගත හැකි හේතු ඇතොත් පමණි.

8. අයදුම් පත්‍රයේ තමා අපේක්ෂා කරන තනතුරට අදාල විෂය පැහැදිලිව දැක්වීම ඉතා වැදගත් අවශ්‍යතාවයක් බව සැලකුව මැනවි.

බෙ. ගු. ධ. ප්‍රනාන්දු,
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ,
ගාල්ල.

1973 ඔක්තෝබර් මස 19 වෙනි දින,
ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ගාල්ල.

11-377/1—73.11.09 දින අංක 85 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### ගාල්ලේ බහුතාක්ෂණික ආයතනය—බාහිර ශිල්ප ප්‍රදර්ශක තනතුරු 1974 වර්ෂය

ගාල්ලේ, බහුතාක්ෂණික ආයතනයේ බාහිර ශිල්ප ප්‍රදර්ශක තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර පහත සඳහන් ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කර ගාල්ලේ, බහුතාක්ෂණික ආයතනයේ විදුහල්පති වෙත 1973 නොවැම්බර් මස 30 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ යැවිය යුතුය. අපේක්ෂකයින් තම තමන්ගේ අධ්‍යාපනික, වෘත්තීය හා කාර්මික සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සියලුම විස්තර ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.

2. බාහිර ශිල්ප ප්‍රදර්ශක තනතුරු වලට අදාල විෂයයන් මෙහි පහත සඳහන් කර තිබේ. පන්ති පැවැත්වෙන්නේ සිංහල මාධ්‍යයෙනි.

1. ගොඩනැගිලි වෘත්තීය.
2. විදුලි කම්බි සවිකිරීම.
3. ජලනල සවිකිරීම්.
4. ගුවන් විදුලි යන්ත්‍ර සේවා කිරීම.
5. ස්වයංචල යන්ත්‍රනය.

3. බාහිර ශිල්ප ප්‍රදර්ශකවරුන්ට ගෙවන ගාස්තු ඔවුන්ගේ සුදුසුකම්, පළපුරුද්ද සහ උගන්වන පන්තිය අනුව පැයකට උපරිම වශයෙන් රුපියල් පහ (රු. 5) දක්වා වෙනස්වනවා ඇත.

4. මෙම තනතුරු 1974 අවුරුද්දේ ජනවාරි මාසයෙන් පටන් ගෙන එම අවුරුද්දේ දෙසැම්බර් මස අවසන් වීමට නියමිතය. අවශ්‍යතාවය අනුව ඊට කලින් වුවද අවසන් කරනු ලැබිය හැක.

5. පන්ති පැවැත්වෙනුයේ උදේ 8 සිට සවස 4 දක්වා සහ සවස 4.15 සිට රාත්‍රි 6.45 දක්වා ද හෙයින් මෙම කාලය තුළ ඉගැන්වීමට හැකි අයගෙන් පමණක් ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලැබේ. තමන්ට සුදුසු කාලවේලා ඉල්ලුම් පත්‍රයේ නිසියාකාරව සඳහන් කළ යුතුය.

6. බාහිර ශිල්ප ප්‍රදර්ශකකරුවන් විසින් මධ්‍ය වාර්ෂික පරීක්ෂණයන්හි සහ අභ්‍යන්තර නොවූ පරීක්ෂකයින් නොයොදවන වාර්ෂාව සාන පරීක්ෂණයන්හිදී අමතර ගාස්තුවක් නොමැතිව තමන්ගේ පන්තිවල ශිෂ්‍යයින් පරීක්ෂා කිරීමට උපදේශක මහතුන්ට සහාය විය යුතුය.

7. රාජ්‍ය සේවයෙහි යෙදී සිටින ඉල්ලුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් මගිනි. එවැනි ඉල්ලුම් පත්‍ර නියම කරන ලද දිනට පෙර ගාල්ලේ බහුතාක්ෂණික ආයතනයේ ආයතනාධිපති වෙත නොලැබුනහොත් ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ ප්‍රතික්ෂේප කරනු නොලබන්නේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ඒවා කලටවේලාවට ලැබී ඇති බවට පිළිගත හැකි හේතු ඇතොත් පමණි.

8. අයදුම් පත්‍රයේ තමා අපේක්ෂා කරන තනතුරට අදාල විෂය පැහැදිලිව දැක්වීම ඉතා වැදගත් අවශ්‍යතාවයක් බව සැලකිය යුතුය.

ජෙ. ගු. ධ. ප්‍රනාන්දු,
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ,
ගාල්ල.

1973 ඔක්තෝබර් මස 19 වෙනි දින,
ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ගාල්ල.

### ආදර්ශ අයදුම් පත්‍රය

විදුහල්පති,
ගාල්ලේ, බහුතාක්ෂණායතනය.

බාහිර කථිකාචාර්ය/ශිල්ප ප්‍රදර්ශක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. වයස :————.
3. පෞද්ගලික ලිපිනය (ටැලිපෝන් අංකයක් ඇත්නම් එය ද සඳහන් කරන්න) :————.
4. ව්‍යාපාර ලිපිනය (ටැලිපෝන් අංකයක් ඇත්නම් එයද සඳහන් කරන්න) :————.
5. වෘත්තීය හෝ රක්ෂාව :————.
6. වෙනත් රක්ෂා තිබේ නම් ඒවා :————.
7. ශාස්ත්‍රීය සුදුසුකම් (දින සඳහන් කරන්න) :————.
8. වෘත්තීය සුදුසුකම් (දින සඳහන් කරන්න) :————.
9. සිංහලෙන් පන්ති පැවැත්වීමට හැකි හෝ නොහැකි බව : ————.
10. ඉගැන්වීමේ පළපුරුදුකම් ඇත්නම් ඒවා :————.
11. ප්‍රායෝගික සුදුසුකම් ඇත්නම් ඒවා :————.
12. බාහිර කථිකාචාර්ය වරයෙකු/බාහිර ශිල්ප ප්‍රදර්ශකයෙකු වශයෙන් ඉගැන්වීමට බලාපොරොත්තුවන විෂයයන් :————.

| පාඨමාලාව | විෂයයන් | මාධ්‍යය |
|---|---|---|
| .................. | .................. | .................. |
| .................. | .................. | .................. |
| .................. | .................. | .................. |

13. සතියක් තුලදී ඔබට කළ හැකි උපරිම දේශණ ගණන : ————.
14. ඔබ රජයේ සේවකයෙක්ද ? :————.

එසේ නම් කාර්යාල වේලාවන්ට පිටස්තරව දේශන පැවැත්වීමට සූදානම්ද ? :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

1. රාජ්‍ය සේවයේ යෙදී සිටින ඉල්ලුම් කරුවන් තම ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුත්තේ තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් මගිනි.
2. ඉල්ලුම් පත් 1973. 11. 30 දිනට පෙර විදුහල්පතිට ලැබිය යුතුය.

11-377/2—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වඩු කර්මාන්ත මෝස්තර සම්පාදක තනතුර

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වඩු කර්මාන්ත මෝස්තර සම්පාදක තනතුර සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. සියළුම ඉල්ලුම් පත්‍ර මේ සමග ඇති ආකෘතිය අනුව පිළියෙල කර 1973. 11. 30 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ, කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව, හේමාස් ගොඩනැගිල්ල, කොළඹ 1 යන ලිපිනයට ලැබෙන සේදී ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

2. **වැටුප් පරිමාණය.**—වර්ෂයකට රු. 6,024 න් පටන් ගෙන රු. 144 වාර්ෂික වර්ධක 4 කින් සහ රු. 180 වාර්ෂික වර්ධක 8 කින් අවුරුද්දට රු. 8,040 දක්වා වැඩිවන ඒකාබද්ධ වැටුපක් මේ තනතුරට හිමිවේ.

රු. 6,780 සහ රු. 7,500 ට පෙර කාර්යක්ෂමතා කඩයිම් සහිතයි.

3. **සේවයේ නියුක්ත භාරවීමේ කොන්දේසි :—**

(අ) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් රහිතය.
(ආ) අවුරුදු 3 ක පරිවාස කාල සීමාවකට යටත්ව පත්කරගනු ලැබේ.
(ඇ) රජයේ සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

4. **වයස් සීමාව.**—1973. 11. 30 දිනට වයස අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (සැ. යු. : දැනට රජයේ සේවයේ නියුක්ත ඉල්ලුම් කරුවන්ට මෙම වයස් සීමාව බලපාන්නේ නැත.)

5. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.**—සියළුම ඉල්ලුම් කරුවන් පහත සඳහන් සුදුසුකම් වලින් සමන්විත බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී ලබාගත් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වූ සහතිකයක් හෝ ඊට සමාන හෝ උසස් විභාගයක් සමත් වූ සහතිකයක් තිබිය යුතුය.
(ආ) වඩු කර්මාන්තය පිළිබඳව කාර්මික ගුරු සහතිකය හෝ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වෙලෝනා යාන්ත්‍රික වඩු කර්මාන්ත අභ්‍යාස ආයතනයේ අවුරුදු පාඨමාලාව හදාරා ලැබූ සහතිකය හෝ පිළිගත් කාර්මික විද්‍යාලයක වඩු කර්මාන්තය පිළිබඳව අවුරුදු දෙකකට නොඅඩු පූර්ණකාර පාඨමාලාවක් හදාරා ලැබූ සහතිකයක් තිබිය යුතුය.
(ඇ) කාර්යාල ලී භාණ්ඩ සහ ගෘහ භාණ්ඩ සඳහා සැලසුම් සකස් කිරීම පිළිබඳ අවුරුදු 3 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.
(ඈ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

**සටහන.**—කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වඩු කර්මාන්ත ප්‍රදර්ශක/පරිපාලක ආදී වඩු ශිල්පීය තනතුරක අවුරුදු 10 කට නොඅඩු සේවයක් ඇති නිලධාරීන් සඳහා කණිෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගය සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.

6. ඉල්ලුම්කරුවන් පහත සඳහන් සහතිකවල පිටපත් ස්වකීය ඉල්ලුම් පත්‍රවලට අමුණා ඉදිරිපත් කළ යුතුය. ඒවා ආපසු එවනු නොලැබේ.

(අ) උප්පැන්න ලියා පදිංචි කිරීමේ සහතිකය.

> සැ.යු. :—අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ උපකාර පාඨශාලා රෙගුලාසි සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.

(ආ) උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) වෘත්තීය හා/හෝ ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතික.

(ඈ) මෑතකදී ලබාගන්නා ලද චරිත සහතික තුනක්.

**සංලක්ෂ්‍යය.**—ඉහත සඳහන් සහතික වල මුල් පිටපත් ඉදිරිපත් කරන ලෙස දැනුම් දුන් අවස්ථාවක ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත් වන ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ගැන සලකා බලනු නොලැබේ.

7. දැනට රජය යටතේ හෝ ප්‍රාදේශීය බල මණ්ඩල යටතේ හෝ සේවයේ යෙදී සිටින ඉල්ලුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

8. ඉල්ලුම් කරුවන් ස්වකීය වියදමින් කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට පැමිණිය යුතුය.

9. ඉල්ලුම් පත්‍රයේ ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බැව් තෝරා ගනු ලැබීමට ප්‍රථම අනාවරණය වුවහොත්, නුසුදුසු සේ කිරීමටද, තෝරා ගනු ලැබීමෙන් පසුව අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කිරීමටද ඉල්ලුම්කරුවන් යටත් විය යුතුය.

10. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (III) වැනි ඡේදයේ ආරම්භයෙහි සඳහන් වන්නාවූද, රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාල වන්නාවූ ද, පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

ජී. පී. හත්තොටුව,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කළමනාකාරිත්ව)
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ වෙනුවට.

**1973 ඔක්තෝබර් 16 වැනි දින,**
**කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ,**
**කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේදීය.**

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වඩු කර්මාන්ත මෝස්තර සම්පාදක තනතුර**

(සැ. යු.—ඉල්ලුම් පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ වඩු කර්මාන්ත මෝස්තර සම්පාදක තනතුර යනුවෙන් සඳහන් කළ යුතුය.)

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා උපන් ස්ථානය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය.)
4. ජාතිය :————.
5. විවාහකද අවිවාහකද යන බව :————.
6. අධ්‍යාපන සහ/හෝ ශිල්පීය සුදුසුකම් :————
   (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)
7. පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා සහ/හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.
   (මේ සම්බන්ධයෙන් ලත් සහතිකවල පිටපත් අයදුම්පතට යා කළ යුතුය.)
8. මීට කලින් ආණ්ඩුවේ යම්කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කළේ නම් එයින් අස්වීමට හේතුව සඳහන් කරන්න :————.
9. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වැරදිකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.
10. චරිත සහතික දී ඇති පුද්ගලයන් තිදෙනාගේ නම් සහ පදිංචි නාම :————.
    (i)
    (ii)
    (iii)

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11-253—73.11.09 දින අංක 85 දරන ගැසට් පත්‍රය

---

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ පහත සඳහන් තනතුර සඳහා ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම්කරුවනට පහතින් දැක්වෙන 1 වැනි හෝ 2 වැනි කොටසට ඇතුළත් සුදුසුකම් තිබිය යුතුයි.

**1. කාර්මික සැලසුම් සම්පාදන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ තනතුර.**

**සුදුසුකම්.**—(අ) ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක්.

(ආ) පිළිගත් ආයතනයක, රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක විධායක නිලධාරියෙකු හෝ විශ්ව විද්‍යාලයක හෝ වෙනත් පිළිගත් ශිල්පීය ආයතනයක හෝ දේශකයකු වශයෙන් ආර්ථික විද්‍යා පර්යේෂණ විෂයෙහි හෝ සංඛ්‍යාලේඛන විද්‍යාව පිළිබඳ විෂයෙහි හෝ යටත් පිරිසෙයින් අවුරුදු අටක පළපුරුද්ද.

(ඇ) වැටුප් ක්‍රමය.—රු. 1,750—රු. 50×10—රුපියල් 2,250 (සියළු දීමනා අඩංගු මාසික).

2. (අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් සංඛ්‍යාලේඛන විෂය පිළිබඳ විශේෂ අධ්‍යයනය සහිතව ලබාගත් උපාධිය.

(ආ) පිළිගත් ආයතනයක, රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක කර්මාන්ත සංඛ්‍යාලේඛන කටයුතු පිළිබඳ අඩුම වශයෙන් අවුරුද්දක පළපුරුද්දක්වත් ඇතිව සංඛ්‍යාලේඛන දත්තයේ දස අවුරුද්දක විධායක පළපුරුද්ද.

සංඛ්‍යාලේඛන දත්තයන් විශ්ලේෂණය, අර්ථ විග්‍රහය හා අගැයීමෙන් වාර්තා ලිවීමත් පිළිබඳ පුළුල් පළපුරුද්ද අත්‍යවශ්‍ය වේ.

(ඇ) වැටුප් ක්‍රමය—රු. 1,250—රු. 50×10—රුපියල් 1,750 (සියළු දීමනා අඩංගු මාසික).

මෙම තනතුර සඳහා අයදුම් කරන අපේක්ෂකයින්ගේ වයස අවුරුදු 45 ට අඩුවිය යුතුය. ඉහතින් දැක්වෙන වැටුප් ක්‍රම දෙකින් එකක් මත පමණක් ඊට අදාළ සුදුසුකම් අනුව අයදුම්කරුවෙකු තෝරා ගැනීම කෙරෙනු ඇත.

මෙම කාර්යාලයට පැමිණ හෝ ශත 15 ක මුද්දර අලවා නම ලිපිනය ලියූ 9½"×4½" ප්‍රමාණයේ ලියුම් කවරයක් එවීමෙන් හෝ ලබා ගත හැකි ආකෘති පත්‍රයේ විය යුතු අයදුම්පත්, 1973 නොවැම්බර් මස 26 වෙනි දින හෝ ඊට ප්‍රථම පහත සඳහන් අයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. තැපැලේදී නැතිවෙන හෝ ප්‍රමාද වන අයදුම්පත් ගැන ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වග කියන්නේ නැත.

රජයේ සේවකයන්ගේත්, ව්‍යවස්ථාපිත මණ්ඩලවල හා සංස්ථා වල සේවකයන්ගේත් අයදුම්පත් සළකා බලනු ලබන්නේ තෝරා ගනු ලැබුවහොත් ඉල්ලුම්කරු කෙටි දැන්වීමකින් මුදා හරිනු ලබන බවට අදාළ දෙපාර්තමේන්තුවේ, මණ්ඩලයේ හෝ සංස්ථාවේ ප්‍රධානියා විසින් සහතික කරනු ලැබ ඇත්නම් පමණි.

සාමාන්‍යාධිකාරී,
ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය.

අංක 615, ගාලු පාර,
කටුබැද්ද-මොරටුව,
1973. 10. 29 දින.

11-364—73.11.09 දින අංක 85 දරන ගැසට් පත්‍රය

## ධීවර දෙපාර්තමේන්තුව

### පර්යේෂණ නිලධාරි තනතුරු

ධීවර දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරි තනතුරු 4ක් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙම නිලධාරීන් විසින්,

1. ධීවර ජීව විද්‍යාව (සත්ව විද්‍යාව/මුහුදුපැලෑටි විද්‍යාව)

2. ධීවර ජීවමිති විද්‍යාව පිළිබඳ පර්යේෂණ හා විමර්ශන කටයුතු ඉටුකෙරෙනු ඇත.

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව, පිළියෙල කළ ඉල්ලුම් පත්‍ර පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 3, ගාළු මුවදොර, තැ. පෙ. 1707 ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර 1973 දෙසැම්බර් මස 5 වෙනිදා.
(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර 1973 දෙසැම්බර් මස 5 වෙනිදා.

**සටහන.**—(i) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගතයුතුය.

(ii) පිටරටවල අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) **වෛද්‍ය පරීක්ෂණ හා නැව් ගාස්තු.**—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියේ පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. තුන් අවුරුදු ආධුනික කාලයකට යටත්ව පත්වීම කරනු ලැබේ. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරණ නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත්, ඔහු අළුත් තනතුරෙහිද විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ලැබීමට තවදුරටත් හිමිකම් ලබනු ඇත. පළමුකොට ඔහු නියමිත කාලසීමාවකට වැඩ බැලීමේ තනතුරකට පත් කරනු ලබන අතර, එම තනතුර දැරීමට ඔහු නුසුදුසු යයි සලකනු ලැබුවහොත්, එම කාලය තුළදී ඕනෑම අවස්ථාවක ඔහු මුල් තනතුරට ආපසු පත් කරනු ලැබිය හැකිය.

(ii) අතිරේක පුහුණුව හා පළපුරුද්ද ලැබීම සඳහා නිලධාරිනැනට පිටරට යාමට සිදුවිය හැකිය.

(iii) පිටරට පුහුණුකරවීම පිණිස මේ නිලධාරියා තෝරා ගනු ලැබුවහොත්, එවිට පහත සඳහන් දේ පිළිබඳව ඔහු ශ්‍රී ලංකා ජනරජය සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

(අ) අනිකුත් දේ අතර, නියමිත පුහුණුවීමේ පාඨමාලාවක් විශ්වාසදායක ලෙස හා උද්යෝගිමත් ලෙස හැදෑරීමටත්, එය සතුටුදායක ලෙස නිම කිරීමටත්, පුහුණුව නිමකිරීමෙන් පසු අවශ්‍ය වුවහොත් නියමිත කාලසීමාවකට (ජනරජය විසින් නියම කළ යුතුවූ) ශ්‍රී ලංකා ජනරජයට සේවය කිරීමටත් භාර ගැනීම, හා

(ආ) ගිවිසුමේ වගන්ති හා කොන්දේසි අනුව, කටයුතු නොකළ හොත් (වැටුප්, දීමනා ගමන් වියදම් ගාස්තු ආදී) සම්පූර්ණ පුහුණුව සඳහා ශ්‍රී ලංකා ජනරජය හා/හෝ අනිකුත් ප්‍රදානය කිරීමේ ආයතනයන් මගින් දරණ ලද පුහුණුවීමේ මුළු වියදම ආපසු ශ්‍රී ලංකා ජනරජයට ගෙවීමට භාර ගැනීම.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේ ය—

රු. 7,440 ඒකාබද්ධ වැටුපකින් පටන් ගෙන, රු. 360 බැගින් වාර්ෂික වැටුප් වැඩිවීම් 10 කින් හා රු. 480 බැගින් වාර්ෂික වැටුප් වැඩිවීම් 11 කින් රු. 16,320 දක්වා නගින වාර්ෂික වැටුපකි. රු. 12,000 ට හා රු. 14,880 ට පෙර කාර්යක්ෂමතා කඩයිම් වේ. තෝරාගනු ලබන අයදුම්කරු විසින් ස්වකීය විද්‍යාත්මක කාර්ය ක්ෂෙත්‍රය පිළිබඳව නියමිත පශ්චාත් උපාධියක් හෝ උසස් තත්ත්වයේ ඩිප්ලෝමා සහතිකයක් හෝ ලබා නොගතහොත් රු. 11,520 වාර්ෂික වැටුප් ඉක්මවා යාමට සුදුසුකම් නො ලබනු ඇත.

**සටහන.**—(i) සේවයට බඳවා ගන්නා අවස්ථාවේදී මූලික විද්‍යා උපාධියකට වඩා උසස් වූ පී. එච්. ඩී. හෝ ඇම්. ඇස්. සී. වැනි උපාධියක් ඇති නිලධාරියෙකුට ගෙවනු ලබන, ආරම්භක වාර්ෂික වැටුප රු. 8,520 ක් වනු ඇත.

(ii) තෝරාගනු ලැබූ අයදුම්කරුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඔහුට වැටුප් පිළිබඳ අනුග්‍රහයක් දිය යුතුවේනම්, ආයතන අධ්‍යක්ෂගෙන් විමසීමෙන් පසු ඔහු වැටුප් ක්‍රමයේ සුදුසු පියවරක තබනු ඇත.

4. **සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයක් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) 1973 දෙසැම්බර් 5 දිනට වයස අවුරුදු 21 ට නො අඩු සහ අවුරුදු 35 ට නොවැඩි බව,

(ඇ) පහත සඳහන් විෂයයන් පිළිබඳව විශේෂඥ දැනුමක් ලබා ඇති පිළිගත් විශ්ව විද්‍යාලයක පළමුවැනි හෝ දෙවැනි පන්තියේ ගෞරව උපාධිධරයෙකු බව.

(1) **ධීවර ජීව විද්‍යාව සඳහා—**

(i) සත්ව විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය (මත්ස්‍ය විද්‍යාව/සමුද්‍ර ජීව විද්‍යාව හදාරා ඇති අයට වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.) හෝ

(ii) උද්භිද විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය (මුහුදු පැළෑටි විද්‍යාව හදාරා ඇති අයට වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.)

(2) **ධීවර ජීවමිති විද්‍යාව—**

ගණිතය පිළිබඳ විශේෂ උපාධිය. (අවසාන විභාගයට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයදුම්කරුවනට ද ඉල්ලුම් කළ හැකිය.)

5. පහත සඳහන් ලියකියවිලිවලින් එකක් හෝ සියල්ලම හෝ අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂයෙකුම සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක් (මින් එකක් අධ්‍යයන කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.)

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සටහන.**—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් ගැන සළකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම නමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත් තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ ධීවර අමාත්‍යාංශයේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම දැනුම් දිය යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම ධීවර අමාත්‍යාංශයේ ලේකම් තැනට හැර, මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ 1 වෙනි කොටසේ (IIඅ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

9. අපේක්ෂකයන්ගේ අයදුම්පත් භාරගන්නා අවසාන දින සිට සති තුනක් ඇතුළත එම අයදුම්පත ලැබුණු බව දන්වනු ලැබේ. එසේ දැන්වීමක් නො ලැබුණු විට ඒ බව වහාම කොළඹ 3, ගාළු මුවදොර, තැ. පෙ. 1707, ධීවර. අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් දිය යුතුයි.

ධීවර අමාත්‍යාංශයේ ලේකම්.

1973 ඔක්තෝබර් 30 වෙනි දින,
කොළඹ 3, ගාළු මුවදොර,
තැ. පෙ. 1707,
ධීවර අමාත්‍යාංශයේ දී ය.

**ධීවර දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිළධාරි තනතුර සඳහා ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

(සැ. යු.—ඉල්ලුම් පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස, මුදුන් කෙළවරේ 'ධීවර දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිළධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය' යන පාඨය ලියා එය ලියාපදිංචි තැපැලෙන්, කොළඹ 3, තැ. පෙ. අංක 1707, ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය).

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා ස්ථානය :————.
   1973 දෙසැම්බර් 5 දිනට වයස, අවු. :————, මාස :————, දින :————.
4. ජාතිය :————.
5. විවාහකද, අවිවාහකද යන බව :————.
6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. වෘත්තීය සුදුසුකම් :————.
8. පාසැලෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර (සේවය භාර ගැනීමේ සහ අස්වීමේ දින සහ අස්වීමට හේතු සඳහන් කළ යුතුය.) :————.
9. දැනට කරන රක්ෂාව :————.
10. චරිත සහතික දී ඇති පුද්ගලයින්ගේ නම් හා පදවි නාමයන් :————.
11. වෙනත් සුදුසුකම් :————.
12. ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන්නේ කුමන පර්යේෂණ හා විමර්ශන කාර්ය ක්ෂේත්‍රය සඳහා ද යන වග :————.

ම විසින් මෙම අයදුම් පතෙහි සපයා ඇති විස්තර සත්‍ය බව ද, නිවැරදි බව ද, මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුණහොත්, ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමට ද, මේ තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව, එම වරද දැනගන්නට ලැබුණහොත්, කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමට, බැඳී ඇති බව ද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11-381—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**රජයේ කලා හා කලාශිල්ප විද්‍යාලයේ බාහිර කථිකාචාර්ය තනතුරු 1974 අධ්‍යයන වර්ෂය**

රජයේ කලා හා කලාශිල්ප විද්‍යාලයේ බාහිර කථිකාචාර්ය තනතුරු සඳහා අයදුම්පත් භාරගනු ලැබේ. පහත සඳහන් විෂයයන් සඳහා බාහිර කථිකාචාර්යවරුන් වුවමනා කර තිබේ :—

විෂයයන් :
1. භාෂාව (සිංහල)
2. භාෂාව (ඉංග්‍රීසි)
3. ගණිතය (සිංහල)
4. සමාජ අධ්‍යාපනය (සිංහල)
5. චිත්‍ර (සිංහල)
6. මූර්ති (සිංහල)
7. ග්‍රැෆික් (සිංහල)
8. මැටි කර්මාන්තය (සිංහල)
9. රෙදි මුද්‍රණය හා විවීම (සිංහල)
10. කෙඳි කර්මාන්තය (සිංහල)
11. ඡායාරූප ශිල්පය (සිංහල)

**කාල.**—පන්ති සතියේ දිනවල පෙ. ව. 8.00 සිට ප. ව. 6.00 දක්වා ද, (සෙනසුරාදා දිනවල පන්ති පෙ. ව. 8.00 සිට ප. ව. 3.30 දක්වා ද) පැවැත්වේ.

**ගාස්තු.**—බාහිර කථිකාචාර්යවරුන්ට කෙරෙන ගෙවීම් පැයකට රු. 2.50 සිට රු. 18.75 දක්වා වෙයි. තෝරාගත් අයදුම්කරුවන්ට භාණ්ඩාගාරයෙන් අනුමත කරන පාඨමාලා තත්ත්වය අනුවත්, ඔවුන්ගේ අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් අනුවත් ගෙවීම් කරනු ලැබේ. ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**සේවා කොන්දේසි.**—මෙම පත්වීම කරනු ලබන්නේ 1974 ජනවාරි මස සිට දෙසැම්බර් මාසයේ අවසානය දක්වා එක් අධ්‍යයන වර්ෂයකටය. එහෙත් මෙම පත්වීම අධ්‍යයන වර්ෂය තුල කවර වේලාවකදී වුවද හේතුන් නොදක්වා අවසන් කිරීමට පුළුවන.

බාහිර කථිකාචාර්යවරුන් විසින් ඔවුන්ට දෙනු ලබන නිර්දේශ පත්‍ර අධ්‍යයන වර්ෂය තුළදී සම්පූර්ණ කිරීම පිණිස යොදන්නට අදහස් කරන කාර්ය මාලාව, වාරය පටන් ගැනීමට පෙර ඉදිරිපත් කළ යුතුය. එසේම අධ්‍යයන වර්ෂය තුළදී ඔවුන් පවත්වන දේශන සම්මත කරන ලද කාර්ය මාලාවට අනුව විය යුතුය.

වර්ෂාවසාන පරීක්ෂණයට බාහිර පරීක්ෂකවරුන් පත් කෙරෙන අවස්ථා වලදී හැර, අනෙකුත් වාරවල පරීක්ෂණ හා වර්ෂාවසාන පරීක්ෂණවලදී තම තමන්ගේ පන්තිවල ශිෂ්‍යයන්, කිසිදු ගෙවීමක් නොලබා පරීක්ෂා කිරීම බාහිර කථිකාචාර්යවරුන් විසින් කළ යුතුය.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි දක්වෙන ආදර්ශ ඉල්ලුම් පත්‍රය අනුව පිළියෙල වුනු ඉල්ලුම් පත් පිටපත් දෙකක් 1973 නොවැම්බර් මස 30 වැනි දින හෝ ඊට පෙර විද්‍යාලයාධිපති, රජයේ කලා හා කලා ශිල්ප විද්‍යාලය, 46, හෝර්ටන් පෙදෙස, කොළඹ 7, යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

ඒ. ජේ. එස්. ගුණවර්ධන,
කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලය,
කොළඹ 7.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම :————.
2. වයස :————.
3. පෞද්ගලික ලිපිනය (ටැලිෆෝන් අංකයක් ඇත්නම් එය ද සඳහන් කරන්න) :————.
4. ව්‍යාපාර ලිපිනය (ටැලිෆෝන් අංකයක් ඇත්නම් එය ද සඳහන් කරන්න) :————.
5. වෘත්තීය හෝ රක්ෂාව :————.
6. වෙනත් රක්ෂා තිබේනම් ඒවා :————.
7. ශාස්ත්‍රීය සුදුසුකම් (දින සඳහන් කරන්න) :————.
8. වෘත්තීය සුදුසුකම් (දින සඳහන් කරන්න) :————.
9. සිංහලෙන් පන්ති පැවැත්වීමට හැකි හෝ නොහැකි බව :————.
10. ඉගැන්වීමේ පළපුරුදුකම ඇති නම් ඒවා :————.
11. ප්‍රායෝගික සුදුසුකම් ඇත්නම් ඒවා :————.
12. බාහිර කථිකාචාර්යවරයෙකු වශයෙන් ඉගැන්වීම බලාපොරොත්තු වන විෂයයන් :————.
13. සතියක් තුළදී ඔබට කළ හැකි උපරිම දේශන ගණන :————.
14. ඔබ රජයේ සේවකයෙක් ද :————.

එසේ නම් කාර්යාල වේලාවන්ට පිටස්තරව දේශන පැවැත්වීමට සූදානම් ද :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

11-265—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

### II වෙනි ශ්‍රේණියේ ඕවර්සියර් තනතුරු

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ ඕවර්සියර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල වුණු අයදුම්පත් 1973. 12. 15 වන දිනට හෝ ඊට ප්‍රථම මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට (ඒකාබද්ධ) රු. 3,450—90×11—රු. 4,440.

**සටහන.**—(1969. 10. 01 දිනට පෙර පැවති කල්පිත මූලික වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 1,320—72×11—රු. 2,112 වේ.)

3. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක් ම—

(i) 1973. 11. 09 දිනට වයස අවුරුදු 21 ට නොඅඩු අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. දැනට රජයේ සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.

(ii) යහපත් චරිතයකින් හා මනා ශරීර ශක්තියකින් යුක්ත විය යුතුය.

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ,

(ආ) දෙකකට නොවැඩි වාර ගණනක දී ගණිතය සහ සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් 6 කින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉතිහාසය හෝ බෞද්ධාගම හෝ භූගෝල විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් සහිතව සමත් විය යුතුය.

(ඇ) කණිෂ්ඨ කාර්මික ආයතනයක ගොඩනැගිලි නිර්මාණය සන්ධ්‍යා තුන් අවුරුදු පාඨ මාලාව සමත් වී සිටිය යුතුය.

නැතහොත්

කණිෂ්ඨ කාර්මික ආයතනයක ගොඩනැගිලි නිර්මාණය අර්ධකාල දිවා තුන් අවුරුදු පාඨ මාලාව සමත් වී සිටිය යුතුය.

නැතහොත්

ඊට සමාන වෙනත් සුදුසුකම් තිබිය යුතුය.

4. රජයේ සේවයේ දැනටමත් නියුක්ත අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසු මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් නියමිත දිනට පෙර දෙපාර්තමේන්තු ප්‍රධානියාට ලැබී ඒවා පමාවීමට සැහෙන හේතු ඇතිව භාරගන්නා ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිර්දේශ කළහොත් මිස භාරගනු නො ලැබේ.

5. අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත්වලට පහත සඳහන් සහතික වල පිටපත් ඇමිණිය යුතුය :—

(අ) ලබාගෙන ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.

(ආ) උප්පැන්න සහතිකය.

(ඉ) මෑතදී ලබාගත් චරිත සහතිකය.
(මෙකී පිටපත් ආපසු එවනු නො ලැබේ)

6. අයදුම්පත් හා ඊට අදාළ වෙනත් ලියකියවිලි පුරාවිද්‍යා කොමසාරිස් වෙත මිස, මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙක් වෙත පෞද්ගලිකව නොඑවිය යුතුය.

7. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ IIඅ වෙනි ඡේදයේ ආරම්භයෙහි ප්‍රසිද්ධ කර ඇති රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම්වලට අදාළ වන සාමාන්‍ය කොන්දේසිවලට අවධානය යොමු කෙරේ.

රාජා ද සිල්වා,
පුරාවිද්‍යා කොමසාරිස්.

### අයදුම්පත් ආකෘතිය

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ ඕවර්සියර් තනතුරු

1. සම්පූර්ණ නම :————.
2. ස්ථිර ලිපිනය :————.
3. (අ) උපන් දිනය :————.
   (ආ) ———— දිනට වයස :————.
4. ලංකාවේ පුරවැසියෙක් ද යන බව :————.
5. අධ්‍යාපනික සුදුසුකම් :————.
6. වෘත්තීය හා කාර්මික සුදුසුකම් :————.
7 පාසලෙන් අස්වීමෙන් පසු කළ රක්ෂා :————.

මෙම අයදුම්පතෙහි ම විසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් දැනගතහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු කිරීමට හැකි බවත්, පත් කරනු ලැබුවායින් පසු සොයා ගතහොත් කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කර දැමිය හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11–341—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා රජයේ වාණිජ (ඒකාබද්ධ අපනයන) නීතිගත සංස්ථාව

### පුරප්පාඩු

පහත දැක්වෙන තනතුරු සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා රටවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**ආධුනික කණිෂ්ඨ විධායක නිලධාරීන් :**

**වයස.**—අවුරුදු 25 ට අඩු විය යුතුය.

**සුදුසුකම්.**—සම්මාන 3 ක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය විභාගයෙන් විෂයයන් 6 ක සාමාර්ථය.

**පළපුරුද්ද.**—ප්‍රධාන අපනයන නිෂ්පාදන හා සම්බන්ධ වෙළඳ ආයතනයක සේවය කර/හෝ පුහුණුව ලබා ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**පාරිතෝෂිකය.**—1 වන වසරේ දී සියල්ල ඇතුළුව මසකට රු. 200ක දීමනාවක්. 2 වන හා 3 න් වන වසරවලදී—සියල්ල ඇතුළුව මසකට රු. 250 ක දීමනාවක් ;

සුදුසු බව දනුනහොත් 3 වන වසරේ අවසානයේ ස්ථිර කිරීමෙන් පසු සියල්ල ඇතුළුව මසකට රු. 600—10×40—රු. 1,000 ක වැටුප් තලය මත මසකට සියල්ල ඇතුළුව රු. 600 ක වැටුපක් ගෙවනු ඇත.

තෝරා ගන්නා ලද අයදුම්කරු විසින් 1956 අංක 33 දරණ රාජ්‍යය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු වස් දැනටමත් පනවා ඇති නීති මෙන්ම පනවනු ලබන නීතිවලට අනුකූලව ක්‍රියා කළ යුතුවේ.

සහතිකපත් පිටපත් සමඟ අයදුම්පත් 1973 නොවැම්බර් මස 30 වන දින හෝ ඊට ප්‍රථම මෙම කාර්යාලයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ.

සී. ලුඩිකින්ස්,
සභාපති,
ශ්‍රී ලංකා රජයේ වාණිජ (ඒකාබද්ධ අපනයන)
නීතිගත සංස්ථාව.

තැ. පෙ. 263,
68/70, යෝර්ක් වීදිය,
කොළඹ 1,
73. 11. 1 වනදා.

11–359—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

## ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය

### ඇගයීමේ නිලධාරි තනතුරු සඳහා පුරප්පාඩු—කපු ඇගයීමේ රසායනාගාරය, කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය

උඩවලවේ යෝජනා ක්‍රමයට අයත් එරම්නියායෙහි කෘෂිකර්ම මධ්‍යස්ථානයේ කපු ඇගයීමේ රසායනාගාරයට ඇගයීමේ නිලධාරි තනතුරු දෙකක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් අවුරුදු 22 ටත් 32 ටත් අතර වයස් සීමාවන්හි සිටිය යුතු අතර, භෞතික විද්‍යාව සහ ගණිතය ඇතුළුව පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යා උපාධියක් ඔවුනට තිබිය යුතුයි. සියල්ලම අන්තර්ගතව අවුරුද්දකට රු. 6,360—10×180—රු. 8,160 දරණ වැටුප් පරිමාව මත මණ්ඩලයේ සේවයෙහි VI වැනි ශ්‍රේණියට පත්වීම් දෙනු ලැබේ.

අයදුම්කරුගේ නම, වයස, උපන් දිනය, අධ්‍යාපනික හා අතිකුත් සුදුසුකම් සහ පළපුරුදුකම් දැක්වෙන අයදුම් පත් 1973 නොවැම්බර් මස 30 වැනි දින හෝ ඊට ප්‍රථම මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

සභාපති,
ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය.

415, බෞද්ධාලෝක මාවත,
කොළඹ 7,
1973 ඔක්තෝබර් 30.

11–321—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

(ඇ) විදේශීය විශේෂඥයන්ගේ අනුරූප නිලධාරීන් වශයෙන් ක්‍රියා කළ යුතු අතර, අන්තර් ජාතීය කණ්ඩායමක සාමාජිකයෙකු වශයෙන් ක්‍රියා කිරීමේ හැකියාවක් තිබිය යුතුය.

(ඈ) දිවයිනේ ඕනෑම පළාතක ක්ෂේත්‍ර වැඩ කිරීමට සූදානම් විය යුතුය.

(ඉ) සේවක අර්ථ සාධක අරමුදලට මුදල් ගෙවිය යුතු අතර, 1972 අංක 5 දරණ ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනත යටතේ දැනට පනවා ඇති හා අනාගතයේ පැනවිය හැකි රෙගුලාසිවලට යටත් විය යුතුය.

3. සාමාන්‍ය කොන්දේසි :

1. පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) පිළිගත් පුද්ගලයන් දෙදෙනෙකුගෙන් ලබා ගත් චරිත සහතික දෙකක් ; ඉන් එකක් අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපන කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ (ආචාර්ය) මහාචාර්ය තැනගෙන් විය යුතුය.

(ඇ) ලබාගත් ඉහළම අධ්‍යාපන සහතිකය.

(ඈ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි විෂයයවලින් සමත් වූ ඉහළම විභාගය පිළිබඳ සහතිකය.

2. ඉල්ලුම්පත් ලැබුණු බවට දැනුම්දීමක් නොකරනු ඇත. මෙම දැන්වීමේ අවශ්‍යතාවලට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත. අවශ්‍ය වූ විට ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

3. කොළඹ දී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට අයදුම්කරුවන් කැඳවනු ඇත. ගමන් වියදම් හෝ වෙනත් වියදම් නො ගෙවනු ඇත.

4. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයක් හා සෞඛ්‍ය තත්ත්වයක් ඇති බව ඔප්පු කළ යුතුය.

5. දැනට රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් හැර සෙසු තෝරා ගත් අපේක්ෂකයන් රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් කරනු ලබන දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට සුදුසු බව පරීක්ෂා කිරීම සඳහා සෞඛ්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

6. රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා ආයතනවල සේවය කරන අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ගැන සලකා බලනු ලබන්නේ, මෙම තනතුරට තෝරා ගතහොත් මුදා හැරීමට සූදානම් බවට නිර්දේශයක් සහිතව දෙපාර්තමේන්තු/සංස්ථා/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළහොත් පමණි.

7. එකකට වැඩි තනතුරු ගණනක් සඳහා අයදුම්පත් එවීමට අදහස් කරන අය එක් එක් තනතුර සඳහා වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. අයදුම් කරන තනතුර කවරයේ වම් පස උඩ කෙළවරේ සඳහන් කළ යුතු වේ.

අධ්‍යක්ෂ,
ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

33, එළිබෑන්ක් පාර,
කොළඹ 5.

11–400—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

### වෛද්‍ය නිලධාරි තනතුර

ලංකා රජුවැසියන්ගෙන් මෙම සංස්ථාවේ වෛද්‍ය නිලධරි තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **තනතුරට අදාල සුදුසුකම්.**—අවුරුදු පහකට වඩා පළපුරුද්දක් සහිතව එම්.බී.බී.එස්. (ශ්‍රී ලංකා හෝ ලන්ඩන්) හෝ ඊට සමාන.

2. **වයස් සීමාව.**—1973 නොවැම්බර් මස 15 වෙනි දිනට අවුරුදු 45කට නොවැඩිවීම.

3. **වැටුප් ක්‍රමය.**—රු. 1,300—50—රු. 1,600 (සියල්ල අඩංගු). තෝරාගනු ලබන අයදුම්කරුගේ පළපුරුද්ද හා අනෙකුත් සුදුසුකම් අනුව සුදුසු වැටුප් තලයක් මත තැබීම සලකා බලනු ලැබේ.

4. **රාජකාරි කටයුතු.**—සංස්ථාවේ වෛද්‍ය ඒකකය ගැන වගකීම ඇතුළුව එහි සේවක මණ්ඩලයේ පරිපාලනය, සංස්ථාවේ සේවකයින් සෝදිසි කිරීම සහ බෙහෙත් නියම කිරීම් යනාදිය, ජීවිත, නීති, කම්කරු වන්දි හා විවිධ අනතුරු දෙපාර්තමේන්තුවල කටයුතු සම්බන්ධව හිමිකම් ඉල්ලා සිටින හා බලාපොරොත්තු වන්නන්ගේ වෛද්‍ය පරීක්ෂණයන් පැවැත්වීම. සෞඛ්‍ය ආරක්ෂණ යෝජනා ක්‍රමයේ හිමිකම් මණ්ඩලවලට හා හිමිකම් මණ්ඩලය ඇතුළු මණ්ඩලවලට හා සංස්ථාවට වෛද්‍ය කටයුතු පිළිබඳ අදහස් අවශ්‍ය වූ විටක උපදෙස් දීම.

නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්ද ඇතුළුව සියළුම විස්තර අඩංගු අයදුම්පත් 1973. 11. 15 දින හෝ ඊට පෙර මාවෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

රජයේ සේවයේ හෝ රජයේ සංස්ථාවල සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළයුතු අතර අයදුම්කරු පුරප්පාඩුව සඳහා තෝරා ගතහොත් ඔහු දෙපාර්තමේන්තුවෙන්/සංස්ථා සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කළයුතුය.

ප්‍රධාන අධිකාරී.

267, යූනියන් පෙදෙස, කොළඹ 2.

11–366—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

## ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

### ඕස්ට්‍රේලියානු රජයේ අපනයන සංවර්ධන හා ආහාර විද්‍යාව පිළිබඳ අභ්‍යාස වැඩ සටහන

කොළඹ ක්‍රමය යටතේ ඕස්ට්‍රේලියානු රජය විසින් පිරිනමනු ලබන අපනයන සංවර්ධන ශිෂ්‍යත්ව දෙකක් සහ ආහාර විද්‍යාව පිළිබඳ ශිෂ්‍යත්වයක් සඳහා පෞද්ගලික අංශයේ කාර්ය මණ්ඩලවලින් අයදුම්පත් කැඳවනු ලැබේ.

අපනයන සංවර්ධන අභ්‍යාස වැඩ සටහනෙහි පරමාර්ථය වනුයේ, ඕස්ට්‍රේලියානු කර්මාන්ත සහ වෙළඳ ව්‍යාපාරවල විදේශීය වෙළඳාම නගාලීම පිළිබඳව පවතින දියුණු ක්‍රම ගැන වෙළඳ ව්‍යාපාරිකයින් පුහුණු කිරීම වේ. ඕස්ට්‍රේලියාවේ භාවිතා කරන ක්‍රම ශ්‍රී ලංකාවේ අවස්ථාවන්ට හා අවශ්‍යතාවන්ට සරිලන පරිදි උපයෝගී කරගත යුතු බැවි, මීට සහභාගි වන්නන්ට අවබෝධ වනු ඇත. ආහාර විද්‍යාව පිළිබඳ අභ්‍යාස වැඩ සටහන සකස් කොට ඇත්තේ, ආහාර සුරක්ෂිත කොට තැබීම සහ අලෙවි ක්‍රම කාර්යක්ෂම ලෙස භාවිතා කිරීමේ වැදගත්කම ගැන අගය කිරීම පිළිබඳ අවබෝධයක් ඇති කර ගැනීම පිණිසය.

**සුදුසුකම්**

**අපනයන සංවර්ධන**

අපනයන සංවර්ධන අභ්‍යාස පාඨමාලාව සඳහා අයදුම්කරන අපේක්ෂකයින් අපනයනය පිළිබඳ ප්‍රායෝගික දැනුමක් දක්වන පෞද්ගලික ආයතනයන්හි විධායක වෙළඳ ව්‍යාපාරිකයින් විය යුතු ය. ඔවුහු ඉහත ඉල්ලා ඇති තත්ත්වයේ රැකියාවක යෙදී සිටිය යුතු අතර, අපනයන ක්‍රියා පිළිවෙල සහ විකුණුම් ක්‍රම පිළිබඳ මනා දැනුමක් ද සහිත විය යුත්තාහ.

**ආහාර විද්‍යාව**

ආහාර විද්‍යාව පිළිබඳ අභ්‍යාස පාඨමාලාව සඳහා ඉල්ලුම් කරන අපේක්ෂකයින් ආහාර විද්‍යාව පිළිබඳ ක්ෂේත්‍රයේ පළපුරුදුකම් ඇති, විශේෂයෙන්ම අනුජීවි විද්‍යාව පිළිබඳ අධ්‍යයනය ද ඇතුළුව ආහාර විද්‍යාවට සම්බන්ධ ක්ෂේත්‍රයක විශ්ව විද්‍යාල උපාධි සුදුසුකමක් සහිත මැද මට්ටමේ රැකියාවක නියුක්ත (Middle Level Personnel) අය විය යුතුයි.

අභ්‍යාස වැඩ සටහන සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයින් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු අතර, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු අය විය යුතුය.

**ශිෂ්‍යත්ව කාලය**

අපනයන සංවර්ධන ශිෂ්‍යත්ව කාලය සති 5 ක් සහ ආහාර විද්‍යා ශිෂ්‍යත්ව කාලය සති 11 ක් වන්නේ ය.

**ප්‍රදානයේ කොන්දේසි.**—(අ) පුහුණුව සඳහා තෝරාගනු ලබන පුද්ගලයින් විසින් හෝ ඔවුන්ගේ සේවා යෝජකයින් විසින් හෝ රජයේ ආදායමට රු. 6,142 ක් ගෙවිය යුතුය. විශේෂ අවස්ථාවන්හි දී පමණක් මෙම අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම ගැන සලකා බැලිය හැක.

(ඊ) (I) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක විදුලි ඉංජිනේරු විද්‍යා විෂයයන් සහිතව බී.එස්.සී. ඉංජිනේරු උපාධිය ලබා තිබීම. හෝ

(ii) ඒ. එම්. අයි. ඊ. ඊ. I වැනි II වැනි III වැනි කොටස් වලින් සමත්වී තිබීම. හෝ

(iii) සමාන හෝ උසස් සුදුසුකම් ලබා තිබීම සහ

(ඩී) අයදුම්කරුවන්ට සිංහලෙන් වැඩ කිරීමට මනා දැනුමක් තිබිය යුතුය. සිංහල ප්‍රවීණතාවය නොමැති අයදුම්කරුවන් පත්වීමේ සිට අවුරුදු 3ක් ඇතුලත නියමිත තත්ත්වයක සිංහල ප්‍රවීණතාවයක් ලබාගත යුතුය.

සටහන.—විශ්ව විද්‍යාලයක හෝ සමාන තත්ත්වයේ ආයතනයක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති අපේක්ෂකයින් හා ඉහත සඳහන් සුදුසුකම් ඇති අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්මික ආයතනයක්හි සේවයේ සිටින අපේක්ෂකයින් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සැම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතු ය.

(ඒ) උප්පැන්න සහතිකය (සැ.යු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසල් ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතික;

(සී) චරිත සහතික දෙකක්, (මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්‍යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතු ය) ;

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(ඊ) සිංහල, දෙමල හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ.යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන් ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිළධාරීන් විසින් එවනු ලබන අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් දිනට පසුව එවන අයදුම්පත් භාරගනු නො ලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියම අවස්ථාවේ ලැබී, ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු ලැබේ. කෙසේ වුවද සැම අයදුම් කරුවකු විසින්ම තම ඉල්ලුම් පත්‍රයේ පිටපතක් නියමිත දිනට පෙර ලැබෙන පරිදි කෙලින්ම මේ අමාත්‍යාංශය වෙත එවිය යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ පුද්ගලික නමට නො එවිය යුතු ය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡෙදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදල වන පොදු කොන්දේසි කෙරෙහි ද අපේක්ෂකයින්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්පත් මේ කාර්‍යාලයට ලැබුණු බව අයදුම්කරුවන්ට දන්වනු ලැබේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 ඔක්තෝබර් 29 දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

අංකය : සාප 7/136.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

(අඟල් 8½ × 13½ ප්‍රමාණයේ කඩදසිවල සකස් කළ යුතුය)

අධ්‍යාපන අමාත්‍යාංශයේ බහුතාක්ෂණික ආයතනයන්හි විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්‍ය තනතුර.

1. නම (මුලකුරු සහිතව) :———. මහතා/මිය/මෙනවිය.
2. සම්පූර්ණ නම :————.
3. රාජකාරී ලිපිනය :————.
4. පෞද්ගලික ලිපිනය :————.
5. (අ) ලාංකිකයෙක්ද යන වග :————.
   (ආ) එසේ නම්, පරම්පරාවෙන්ද, ලියාපදිංචි වීමෙන්ද ? :————.
6. උපන් දිනය :———. අවුරුද්ද :————. මාසය :————.
   දිනය :————.
7. අයදුම් පත් භාර ගන්නා අවසාන දිනයට වයස :—
   අවුරුදු :————. මාස :————. දින :————.
8. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :—
   (අ) තනතුර :————.
   (ආ) ස්ථිරද, තාවකාලිකද? :————.
   (ඉ) විශ්‍රාම වැටුප් සහිතද, රහිතද? :————.
   (ඊ) තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටීද? :————.
   (උ) දෙපාර්තමේන්තුව :————.
   (ඌ) ආයතනය/සේවා ස්ථානය :————.
   (එ) වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය :————.
   (ඒ) දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප :————.
9. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර (සිංහල ප්‍රවීණතාවය/දෙමළ භාෂාව පිළිබඳ ලබා ඇති සහතිකද ඇතුළත්ව.) :—

| | විභාගය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| 1. | ........................ | ............ | ............ |
| 2. | ........................ | ............ | ............ |
| 3. | ........................ | ............ | ............ |
| 4. | ........................ | ............ | ............ |

10. වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :—

| | සහතිකය | නිකුත් කළ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|---|
| 1. | ............ | ............ | ............ | ............ |
| 2. | ............ | ............ | ............ | ............ |
| 3. | ............ | ............ | ............ | ............ |
| 4. | ............ | ............ | ............ | ............ |
| 5. | ............ | ............ | ............ | ............ |

11. සාමාන්‍ය අධ්‍යාපනය ලද ආයතන :—

| | ආයතනය | පන්තිය | සිට | දක්වා |
|---|---|---|---|---|
| 1. | ............ | ............ | ............ | ............ |
| 2. | ............ | ............ | ............ | ............ |
| 3. | ............ | ............ | ............ | ............ |
| 4. | ............ | ............ | ............ | ............ |
| 5. | ............ | ............ | ............ | ............ |
| 6. | ............ | ............ | ............ | ............ |
| 7. | ............ | ............ | ............ | ............ |

12. වෘත්තීය අධ්‍යාපනය ලද ආයතන :—

| | ආයතනය | පාඨමාලාව | සිට | දක්වා |
|---|---|---|---|---|
| 1. | ............ | ............ | ............ | ............ |
| 2. | ............ | ............ | ............ | ............ |
| 3. | ............ | ............ | ............ | ............ |
| 4. | ............ | ............ | ............ | ............ |
| 5. | ............ | ............ | ............ | ............ |

13. කලින් දරූ තනතුරු (නියම දිනයන් දක්වමින් හරියටම වකවානු පිළිවෙලට සඳහන් කරන්න.) :—

| දෙපාර්තමේන්තුව/ආයතනය/ සේවා ස්ථානය | තනතුර | ස්ථිරද, තාව කාලිකද | සිට | දක්වා |
|---|---|---|---|---|
| | | | | |

14. කිසියම් චෝදනාවක් උඩ අධිකරණය මගින් ඔබ වරදකරු වී ඇත්තේද? (එසේ නම්, විස්තර දක්වන්න.) :————

15. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහ කරනු ලැබුවේද? (එසේ නම් විස්තර දක්වන්න) :————.

16. ඔබ මුදල් කරදරවලින් නිදහස්ද? එසේ නොවේ නම් ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණද? :————.

17. මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත්කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————.

අයදුම්කරුගේ අත්සන.

දිනය :—

11–343—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

අංකය : සාප. 7/135.

අධ්‍යාපන අමාත්‍යාංශය

බහු තාක්ෂණික ආයතනයන්හි ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු

අධ්‍යාපන අමාත්‍යාංශයේ, බහුතාක්ෂණික ආයතනයන්හි ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු සඳහා අයදුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහතින් දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම් පත් 1973 නොවැම්බර් මස 30 දින හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම් පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "බහු තාක්ෂණික ආයතනයන්හි ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු" යනුවෙන් සඳහන් කළ යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—තනතුර ස්ථිරය. තෝරාගනු ලබන අපේක්ෂකයින් දැනටමත් විශ්‍රාම වැටුප් සහිත රජයේ තනතුරක් නොදරයි නම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකයන් වනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයින්, පත්වීම ලබන දින රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන්නේ නම්, තවදුරටත් එම විශ්‍රාම වැටුප් අයිතිය භුක්ති විඳිනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයින්, දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත නැතිනම්, මුල් වතාවේ, තුන් අවුරුදු පරිවාස කාලයක් මත පත් කෙරෙනු ඇත. රාජ්‍ය සේවයෙහි නියැලි ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් ඔහුගේ/ඇයගේ පත්වීම එක් අවුරුදු කාල පරිච්ඡේදයක වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත.

(සැ.යු.—තෝරාගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ ඕනෑම බහුතාක්ෂණික ආයතනයක සේවය කිරීමට සූදානම් වී සිටිය යුතුයි. දැනට ඇබෑර්තු ඇත්තේ සිංහල මාධ්‍ය බහුතාක්ෂණික ආයතනවල පමණි).

3. **වැටුප් සහ දීමනා.**—රු. 6,720/–ක වාර්ෂික වැටුපකින් පටන් ගෙන රු. 360/–ක් වාර්ෂික වැටුප් වැඩිවීම් 12 කින් රු. 11,040/– දක්වා නගින ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් මෙම තනතුරට අදාල වේ. (මීට අනුරූපව, 1969.10.01 දිනට පෙර පැවැති වාර්ෂික වැටුප් ක්‍රමය රු. 4,080—12 × 360—8,400/–ක් විය.)

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ට චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව ;

(බී) 1973.11.30 වැනි දිනට තමාගේ වයස අවුරුදු 25 ට නො අඩු හා අවුරුදු 45 ට නොවැඩි බව (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.) ;

(සී) (1) (ඒ) පිළිගත් විශ්ව විද්‍යාලයක ව්‍යාපාර පරිපාලනය හෝ කලමනාකාරිත්වය පිළිබඳ උපාධියක් හෝ

(බී) ව්‍යාපාර පරිපාලනය හෝ කලමනාකාරිත්වය විෂයයක් වශයෙන් ඇතුලත්ව, පිළිගත් විශ්ව විද්‍යාලයක ආර්ථික විද්‍යාව හෝ වාණිජ විද්‍යාව පිළිබඳ ගෞරව හෝ විශේෂ උපාධියක් හෝ

(සී) ලංකා කාර්මික විද්‍යාලයේ වාණිජ ඩිප්ලෝමාව හෝ

(ඩී) සමාන හෝ උසස් සුදුසුකම් ලබා තිබීම.

(2) (ඒ) අවම ඉගැන්වීමේ පළපුරුද්ද අවුරුදු 5 ක් තිබිය යුතුය.

සටහන.—අපේක්ෂකයින් පහත දක්වෙන විෂයයන්ගෙන් යටත් පිරිසෙයින් හතරක්වත් ඉගැන්වීමේ හැකියාව ඇති අය විය යුතුය. 1. ව්‍යාපාර පරිපාලනය 2. කලමනාකාරිත්වය 3. අලෙවිකරණය 4. මූල්‍ය කලමනාකාරිත්වය 5. ආර්ථික විද්‍යාව (මූලධර්ම හා ප්‍රායෝගික) 6. පිරිස් කලමනාකාරිත්වය 7. කාර්යාලීය කලමනාකාරිත්වය 8. කාර්මික සම්බන්ධතා 9. ප්‍රවාහන මූලධර්ම 10. නාවික හා නිර්යාත පරිචය. 11. සංඛ්‍යා ලේඛන.

(ඩී) අයදුම්කරුවන්ට සිංහලෙන් වැඩ කිරීමට මනා දැනුමක් තිබිය යුතුය. සිංහල ප්‍රවීනතාවය නොමැති අයදුම්කරුවන් පත්වීමේ දින සිට අවුරුදු 3 ක් ඇතුලත නියමිත තත්ත්වයක ප්‍රවීනතාවයක් ලබාගත යුතුය.

සටහන.—විශ්ව විද්‍යාලයක හෝ සමාන තත්ත්වයේ ආයතනයක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති අපේක්ෂකයින් කෙරෙහි හා ඉහත සඳහන් සුදුසුකම් ඇති අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්මික ආයතනයන්හි සේවයේ සිටින අපේක්ෂකයින් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතු ය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසල් ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නො ලැබේ).

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතික ;

(සී) චරිත සහතික දෙකක් (මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතු ය) ;

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිළධාරීන් විසින් එවනු ලබන අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් දිනට පසුව එවන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියම අවස්ථාවේ ලැබී, ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු ලැබේ. කෙසේ වුවද සෑම අයදුම්කරුවකු විසින්ම තම ඉල්ලුම් පත්‍රයේ පිටපතක් නියමිත දිනට පෙර ලැබෙන පරිදි කෙලින්ම මෙ අමාත්‍යාංශය වෙත එවිය යුතුය.

7. අයදුම්පත් හෝ ඊ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ පුද්ගලික නමට නො එවිය යුතු ය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡෙදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි කෙරෙහි ද අපේක්ෂකයින්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්පත් මේ කාර්යාලයට ලැබුණු බව අයදුම්කරුවන්ට දන්වනු ලැබේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 ඔක්තෝම්බර් 29 දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දිය.

අංකය : සාප 7/135

අධ්‍යාපන අමාත්‍යාංශයේ බහුතාක්ෂණික ආයතනයන්හි ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ II වැනි ශ්‍රෙණියේ කථිකාචාර්ය තනතුර

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

(අඟල් 8½ × 13½ ප්‍රමාණයේ කඩදසිවල සකස් කළ යුතුය)

1. නම : (මුලකුරු සහිතව) :———— .
   මහතා/මිය./මෙනවිය
2. සම්පූර්ණ නම :————.
3. රාජකාරි ලිපිනය :———— .
4. පෞද්ගලික ලිපිනය :———— - .
5. (අ) ලාංකිකයෙක්ද යන වග :————.
   (ආ) එසේ නම්, පරම්පරාවෙන්ද, ලියා පදිංචි වීමෙන්ද ? :——— — .
6. උපන් දිනය :
   අවුරුද්ද :————. මාසය :———— . දිනය :————- .
7. අයදුම් පත් භාරගන්නා අවසාන දිනයට වයස:
   අවුරුදු :————. මාස :————. දින :——— —.
8. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :—
   (අ) තනතුර :————.
   (ආ) ස්ථිරද, තාවකාලිකද ? :————.
   (ඉ) විශ්‍රාම වැටුප් සහිතද, රහිතද ? :————.
   (ඊ) තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටීද ? :————.
   (උ) දෙපාර්තමේන්තුව :——— —.
   (ඌ) ආයතනය/සේවා ස්ථානය :————.
   (ඍ) වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය :————.
   (ඎ) දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප :————.
9. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර (සිංහල ප්‍රවීණතාවය/දෙමළ භාෂාව පිළිබඳ ලබා ඇති සහතිකද ඇතුළත්ව)

| විභාගය | වර්ෂය | විෂයයන් |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |

10. වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :

| සහතිකය | නිකුත් කළ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

11. සාමාන්‍ය අධ්‍යාපනය ලද ආයතන—

| ආයතනය | පන්තිය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |
| 6. | | | |
| 7. | | | |

12. වෘත්තීය අධ්‍යාපනය ලද ආයතන—

| ආයතනය | පාඨමාලාව | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

13. කලින් දැරූ තනතුරු (නියම දිනයන් දක්වමින් හරියටම වකවානු පිළිවෙලට සඳහන් කරන්න).

| දෙපාර්තමේන්තුව/ ආයතනය/ සේවා ස්ථානය | තනතුර | ස්ථිරද, තාවකාලිකද | සිට | දක්වා |
|---|---|---|---|---|
| | | | | |

14. කිසියම් චෝදනාවක් උඩ අධිකරණය මගින් ඔබ වරදකරු වී ඇත්තේ ද ? (එසේ නම්, විස්තර දක්වන්න) :————.
15. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහ කරනු ලැබුවේද ? (එසේ නම් විස්තර දක්වන්න) :————.
16. ඔබ මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නොවේ නම් ඔබේ ණයකරුස් වල ප්‍රමාණය කොපමණද ? :————.
17. මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත්කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11–344—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

අධ්‍යාපන අමාත්‍යාංශය

දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ රජයේ දෙමළ මාධ්‍ය දුෂ්කර පාසල් වලට සහතික පත්‍ර නොලත් උප ගුරුවරුන් බඳවා ගැනීම

යථෝක්ත කාරණය සම්බන්ධයෙන් අංක 82 හා 1973 ඔක්තෝබර් මස 19 දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ සිංහලෙන් පළ කරන ලද නිවේදනය කෙරෙහි අවධානය මෙයින් යොමු කරවමි.

එම සිංහල නිවේදනයේ අඩංගු ආදර්ශ අයදුම් පත්‍රයේ "දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ රජයේ දෙමළ මාධ්‍ය දුෂ්කර පාසල්වල සහතික පත්‍ර නොලත් සිංහල උපගුරු තනතුරු" යනුවෙන් දක්වා ඇති සිරස් තලය 'දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ රජයේ දෙමළ මාධ්‍ය දුෂ්කර පාසල්වල සහතික පත්‍ර නොලත් උපගුරු තනතුරු' යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. උඩගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1973 ඔක්තෝබර් මස 30 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

11–376—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

අධ්‍යාපන දෙපාර්තමේන්තුව—කුරුණෑගල

කුරුණෑගල කණිෂ්ඨ කාර්මික ආයතනය

බාහිර උපදේශක තනතුරු—1974

අධ්‍යාපන අමාත්‍යංශය යටතේ ඇති කුරුණෑගල කණිෂ්ඨ කාර්මික ආයතනයෙහි බාහිර උපදේශක තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම්පත් කුරුණෑගල කණිෂ්ඨ කාර්මික ආයතනයේ විදුහල්පති වෙත 1973 නොවැම්බර් 30 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙනසේ යැවිය යුතුය. අපේක්ෂකයින් තම තමන්ගේ අධ්‍යාපනික, වෘත්තීය, කාර්මික සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සියලුම විස්තර ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කළ යුතුය. පංති පැවැත්වෙන මාධ්‍යය, විෂයය ඉදිරියෙන් පෙන්වා ඇත. එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් ඉල්ලුම්පත් ලියා පදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය.

සිංහල මාධ්‍යය

(1) සිංහල භාෂාව.

(2) ගණිතය.

(3) තාපය, ආලෝකය, ශබ්දය.

(4) විදුලිය හා කාන්දම් බලය.

(5) ගෘහ නිර්මාන ශිල්පය.

(6) ව්‍යවහාරික ගණිතය.

(7) වාණිජ අංකගණිතය.

(8) වාණිජ භූගෝලය.

(9) යතුරු ලිවීම.

(10) ලඝු ලේඛනය.

(11) වාණිජ විද්‍යා මූලධර්ම.

(12) ගණන් තැබීම.

(13) වාණිජ විද්‍යාව හා මුදල්.

(14) විදුලි කම්බි සවිකිරීම (න්‍යාය).

(15) විදුලි කම්බි සවිකිරීම (ප්‍රායෝගික).

(16) ගුවන් විදුලි යන්ත්‍ර අළුත් වැඩියා කිරීම (න්‍යාය).

(17) ගුවන් විදුලි යන්ත්‍ර අළුත් වැඩියා කිරීම (ප්‍රායෝගික).

(18) කර්මාන්ත ශාලා පුහුණුව.

(19) මැනීම හා මට්ටම් කිරීම.

(20) ජලනල සවිකිරීම (න්‍යාය සහ ප්‍රායෝගික).

(21) විද්‍යුත් කාර්මික විද්‍යාව.

(22) තාප යන්ත්‍ර.

(23) යාන්ත්‍රික ඇඳීම.

(24) සෞඛ්‍ය ඉංජිනේරු විද්‍යාව.

(25) ගණකාධිකරනය.

(26) හේත්තු වැද්දීම (ප්‍රායෝගික.)

(27) හේත්තු වැද්දීම (න්‍යාය.)

(28) සමාජ අධ්‍යයනය.

(29) පිරිවැය ක්‍රම.

(30) විකුණුම් ශාස්ත්‍රය සහ විකුණුම් පාලනය.

ඉංග්‍රීසි මාධ්‍යය

(1) ගණිතය.

(2) යාන්ත්‍රික ඇඳීම.

(3) ව්‍යවහාරික යාන්ත්‍රික විද්‍යාව.

(4) විද්‍යුත් විද්‍යාව.

(5) ද්‍රව්‍ය හා ව්‍යුහ.

(6) තාප යන්ත්‍ර.

(7) ඉංග්‍රීසි භාෂාව.

(8) කර්මාන්ත ශාලා පිරිවැය ක්‍රම.

2. බාහිර උපදේශකවරුන්ට ගෙවන ගාස්තු ඔවුන්ගේ සුදුසුකම්, පළපුරුද්ද හා උගන්වන පංතිය අනුව පැයකට රු. 5 සිට රු. 15 දක්වා වෙනස් වෙනවා ඇත.

3. මෙම තනතුරු අවුරුද්දේ ජනවාරි මස පටන් ගෙන දෙසැම්බර් මාසයෙන් අවසන් වේ. අවශ්‍යතාවයේ හැටියට ඊට කලින් වුවද, අවසන් කෙරෙනු ඇත.

4. පන්ති පැවැත්වෙනුයේ සවස 4.30 සිට රාත්‍රී 7.30 දක්වා පමණි. එහෙයින් මෙම කාලය ඇතුලත උගැන්වීමට හැකි අයගෙන් පමණක් ලැබෙන ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලැබේ.

5. බාහිර උපදේශක වරුන් විසින් මධ්‍ය වාර්ෂික පරීක්ෂණයන්හි හා අභ්‍යන්තර වර්ෂ අවසාන පරීක්ෂණයන්හිදී අමතර ගාස්තුවක් නොමැතිව තමන්ගේ පංතිවල ශිෂ්‍යයන් පරීක්ෂා කල යුතුය.

6. රාජ්‍ය සේවයෙහි යෙදී සිටින ඉල්ලුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ තම තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මගිනි. එවැනි ඉල්ලුම් පත්‍ර නියම කරණ ලද දිනට පෙර විදුහල්පති වෙත නොලැබුනහොත්, ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ ප්‍රතික්ෂේප කරනු නොලබන්නේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ඒවා කලට වේලාවට ලැබී පිළිගත හැකි හේතුවක් නිසා ප්‍රමාද වුවහොත් පමණි.

7. අයදුම් පත්‍රයේ තමා අපේක්ෂා කරන තනතුරට අදාල විෂයය පැහැදිලිව දැක්වීම ඉතා වැදගත්ම අවශ්‍යතාවයක් බව සැලකුව මැනවි.

8. ආදර්ශ අයදුම් පත අනුව ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුතුයි.

පී. බී. රත්නායක,
කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1973ක් වූ ඔක්තෝබර් මස 13 වෙනි දින,
කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ දීය.

කුරුණෑගල කණිෂ්ඨ කාර්මික ආයතනය

බාහිර උපදේශක තනතුරක් සඳහා අයදුම්පත

ඉල්ලන විෂයය :...............

(1) සම්පූර්ණ නම :————.

(2) නම (මුලකුරු සමඟ) :————.

(3) රාජකාරි ලිපිනය :————.

(4) පෞද්ගලික ලිපිනය :————.

(5) දනට දරණ රැකියාව :————.

(6) දනට දරණ තනතුර රජය යටතේද, සංස්ථාවකද, පුද්ගලිකද ? :————.

(7) උපන් දිනය (උප්පැන්න සහතිකය අනුව) :————.

(8) අධ්‍යාපනික සුදුසුකම් :————.

(9) වෘත්තීය සුදුසුකම් :————.

(10) පළපුරුද්ද :————.

(11) ඉගැන්වීම කළ හැකි වේලාව :————.

(12) ස්ත්‍රී පුරුෂ භාවය :————.

(13) දනට ලබන වැටුප් ක්‍රමය හා වැටුප් පෙත්ත :————.

(14) ඉගැන්වීමේ මාධ්‍යය :————.

මා විසින් කරන ලද මේ ප්‍රකාශය මා දන්නා කරමින් ද, මගේ විශ්වාසයේ පරිදි ද, සැබෑ බවත්, නිරවද්‍ය බවත්, මගේ ආත්ම ගෞරවයේ නාමයෙන් මම සහතික කරමි. තවද, මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව හෝ තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු කිරීමටත්, පත්කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත්, මගේ සේවය ඕනෑම අවස්ථාවක අත්හිටවීමට හැකි බවත් මම දනිමි.

————.
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

11–288—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### සිංහල ලඝු ලේඛනය පුහුණු කිරීමේ පන්ති

1973. 10. 26 වැනි දින අංක 83 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ (I කොටස (IIඅ) වැනි ඡේදයේ—පළ කිරීම්) පළවූ උක්ත මැයෙන් වූ දැන්වීමේ 3 වැනි ඡේදයෙහි 3 වැනි වාක්‍යයෙහි "වියදම් ගෙවනු ලැබේ" යන්න "වියදම් ගෙවනු නොලැබේ" යනුවෙන් සංශෝධනය විය යුතුය.

පීටර් පී. අබේසේකර,
රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්.

1973 ඔක්තෝබර් මස 29 වෙනි දින,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
22, ඊඩී මාවත,
කොළඹ 7.

11-282—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය

### විද්‍යා/ගණිත ගුරු ඩිප්ලෝමා පාඨමාලාව (1974-75)

සිංහල මාධ්‍යයෙන් පමණක් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ආරම්භ කිරීමට නියමිත ඉහත සඳහන් පාඨමාලාවන් සඳහා රජයේ සේවයේ නියුතු ගුරුවර/ගුරුවරියන්ගෙන්, මා විසින් අයදුම්පත් භාරගනු ලැබේ.

අයදුම්කරුවන් 1974 ජනවාරි මස 01 දිනට වයස අවුරුදු 30 ට වඩා අඩුවිය යුතු අතර, යටත් පිරිසෙයින් අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙකදී ඒ ඒ පාඨමාලාවන්ට අදාළ විෂයයන් දෙකකින් සමත්ව ඉන් එකකට සම්මාන සාමාර්ථයක් හෝ විෂයයන් තුනකින් හෝ හතරෙන්ම සාමාන්‍ය සාමාර්ථය ලබා තිබිය යුතුය.

පාඨමාලාවට අදාල විෂයයන් :—

1. ගණිතය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව :
   ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, භෞතික විද්‍යාව.
2. භෞතික විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව :
   භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ශුද්ධ ගණිතය හෝ ව්‍යවහාරික ගණිතය.
3. ජීව විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව :
   සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව.

වැඩි විස්තර සහ ඉල්ලුම් පත්‍ර 1973 නොවැම්බර් මස 15 වන දිනට පෙර, රුපියල් දහයක් වටිනා මුදල් ඇණවුමක් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ නමට එවීමෙන් හෝ මෙම කාර්යාලයේ මුදල් ශාඛාවට පැමිණ මුදල් ගෙවීමෙන් පසුව හෝ ලබාගත හැකිවනු ඇත. ඔබ විසින් ලබා ගන්නා ලද එක් අයදුම්පතක් මගින් අයදුම් කළ හැක්කේ එක් පාඨමාලාවක් සඳහා පමණක් බව සැලකිය යුතුය.

දැනට අධ්‍යයන නිවාඩු ලබාගෙන ගුරු විද්‍යාල්වල හෝ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ හෝ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් උසස් අධ්‍යාපනික ආයතනයක හෝ යම්කිසි පාඨමාලාවක් හදාරන අයද, මීට පෙර, අධ්‍යයන නිවාඩු ලබා එවැනි ආයතනයක පාඨමාලාවක් හදාරා ඇති අයද මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට නුසුදුස්සෝ වෙති.

ලේකම්.
විශ්ව විද්‍යාල ප්‍රවේශ මධ්‍ය මණ්ඩලය.

1973 ඔක්තෝබර් මස 29 වෙනි දින,
කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ අංක 202 හි
ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ සනාතන මන්දිරයේ දී ය.

11-360—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළයුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම යැවිය යුතුය.**

සැ. යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව **ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති** වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| නොවැම්බර් | 73.11.02 | සිකුරාදා | ... | 73.10.24 | බදාදා | දවල් | 12.00 |
| | 73.11.09 | සිකුරාදා | ... | 73.10.31 | බදාදා | දවල් | 12.00 |
| | 73.11.16 | සිකුරාදා | ... | 73.11.07 | බදාදා | දවල් | 12.00 |
| | 73.11.23 | සිකුරාදා | ... | 73.11.14 | බදාදා | දවල් | 12.00 |
| | 73.11.30 | සිකුරාදා | ... | 73.11.21 | බදාදා | දවල් | 12.00 |
| දෙසැම්බර් | 73.12.07 | සිකුරාදා | ... | 73.11.28 | බදාදා | දවල් | 12.00 |
| | 73.12.14 | සිකුරාදා | ... | 73.12.05 | බදාදා | දවල් | 12.00 |
| | 73.12.21 | සිකුරාදා | ... | 73.12.12 | බදාදා | දවල් | 12.00 |
| | 73.12.28 | සිකුරාදා | ... | 73.12.19 | බදාදා | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.